සිංගර් ෆිනෑන්ස් හි ප්‍රධාන මූල්‍ය පහසුකම්

- පුද්ගලික හෝ ව්‍යාපාරික භාවිතය සඳහා වාහන, යන්ත්‍ර සූත්‍ර හෝ දේපළ මිලදී ගැනීම් ඇතුළුව ඔවුන්ගේ අරමුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා අපගේ ණය නිර්ණායක සපුරාලන පුද්ගලයන්ට සහ ව්‍යාපාරික ආයතන වලට අපි මූල්‍ය පහසුකම් සපයන්නෙමු.
- වත්කම් (වාහන/යන්ත්‍රෝපකරණ / දේපල) සහ පාරිභෝගිකයාගේ ආපසු ගෙවීමේ හැකියාව සහ අනෙකුත් කොන්දේසි මත පදනම්ව සිංගර් ෆිනෑන්ස් ආයතනය පහසුකම් සඳහා මිල ගණන් පිරිනමන්නේ තරඟකාරී සහ විනිවිදභාවයකින් යුත් ගාස්තු සහ කොන්දේසි මතය.
- මූල්‍ය කරණය, කුලී, උපරිම ආපසු ගෙවීමේ කාලය, අමතර ආරක්ශණ අවශ්‍යතා සහ වෙනත් නියමයන් සහ කොන්දේසි, සන්නාමය, නිෂ්පාදිත රට සහ ඇස්තමේන්තුගත ආර්ථික ජීවිතය, නිෂ්පාදිත වර්ෂය සහ වාහනයට හෝ යන්ත්‍ර සූත්‍ර වලට අදාළ අනෙකුත් සියලුම විචල්‍යයන් අනුව වෙනස් වේ.
- පහසුකමක් ලබා දීමට පෙර, අප විසින් ආපසු ගෙවීමේ හැකියාව, අතීත ගෙවීම් හැසිරීම්, ශුද්ධ ආදායම සහ පාරිභෝගිකයාට අදාළ අනෙකුත් කරුණු ස්වාධීනව ඇගයීමට ලක් කර සත්‍යාපනය කරනු ඇත.
- අප සමඟ ගිවිසුම් අත්සන් කිරීමට පෙර ඔබේ පහසුකමට අදාළ මාසික කුලී සහ අනෙකුත් ගාස්තු පැහැදිලි කරන්නෙමු.
- අපගේ නිලධාරීන් සමඟ සාකච්ඡා කර අපගේ නියමයන් සහ කොන්දේසි ලබා ගැනීමට, සහ පැහැදිලි කර ගැනීමට අපි ඔබට ආරාධනා කරන්නෙමු.
- ගිවිසුමට ඇතුල් වන අවස්ථාවේදී මිල ගණන් සහ අනෙකුත් නියමයන් සහ කොන්දේසි පිළිබඳව ඔබ සිංගර් ෆිනෑන්ස් නියෝජිතයින්ගෙන් තහවුරු කර ගත යුතුය.

ලීසිං

- මෝටර් රථ රෙජිස්ටාර් (RMV) විසින් පිළිගත් සියලුම වාහන කාණ්ඩවලට අපි පහසුකම් සපයන්නෙමු.
- උදා: මෝටර් කාර්, වෑන්, ද්විත්ව කාර්යය වාහන, මෝටර් ලොරි, ඉඩම් වාහන, මෝටර් කෝච් (බස්), ත්‍රිරෝද රථ, මෝටර් බයිසිකල් ආදිය.
- අප විසින් අනුමත කරන ලද නියමයන් සහ කොන්දේසි වලට යටත්ව, ඔබට ඔබේ ආදායම් උත්පාදන රටාවට ගැලපෙන, සමාන කුලී හෝ ව්‍යුහගත ගෙවීම් වලින් ආපසු ගෙවිය හැක.
- 2007 අංක 33 දරණ ෆිනෑන්ස් ලීසිං පනත (සංශෝධන) සහ ගිවිසුම් නීතිය ලීසිං නිෂ්පාදන මූල්‍යකරණයට අදාළ පවතින නීති පනත් වේ.
- පොලී සහ දඩ පොලිය
  - පොලී අනුපාතය: අවම අනුපාතය - 17.50% (වසරකට)
  - උපරිම අනුපාතය - 40.00% (වසරකට)
- දඩ පොලිය: නියමිත පොලියට අමතරව - 4.5% (මාසිකව)

- වෙනත් ගාස්තු
    - සේවා ගාස්තු: ගිවිසුමේ වටිනාකමට අනුව/වාහනයේ වර්ගය අනුව (පහත වගුව බලන්න)
    - රක්ෂණ වාරික ගාස්තුව: රක්ෂණ මිල ගණන් අනුව (වාරිකය මුදල් ලෙස හෝ / සහන කාලයක් ඇතුලත ගෙවිය හැක)
    - RMV හුවමාරු ගාස්තුව: RMV මාර්ගෝපදේශ අනුව
    - තැපැල් ගාස්තු – සාමාන්‍ය තැපෑල : රු. 66.75/- | ලියාපදිංචි තැපෑල : රු. 128/-

චක්‍රීය ණය

- චක්‍රීය ණය සඳහා ආපසු ගෙවීමේ නියමයන් සහ කොන්දේසි නම්‍යශීලී වේ.
- ගිවිසුමට ඇතුල් වන අවස්ථාවේ අප විසින් නියම කරන ලද මාසික අවම පොලී ගෙවීමට යටත්ව ඔබට කැමති පරිදි ආපසු ගෙවිය හැකිය.
- ගිවිසුමේ කාලසීමාව තුළ ඔබට කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන් ණය පහසුකම ගෙවා අවසන් කළ හැකිය.
- 1990 අංක 3 දරන උකස් පනත (සංශෝධන) සහ ගිවිසුම් නීතිය යනු චක්‍රීය ණය සම්බන්ධයෙන් කටයුතු කරන නීති පනත වේ.
- පොලී සහ දඩ පොලිය
    - පොලී අනුපාතය: අවම අනුපාතය - 17.50% (වසරකට), උපරිම අනුපාතය- 30.00% (වසරකට)
    - දඩ පොලිය: නියමිත පොලියට අමතරව - 4.5% (මාසිකව)
- වෙනත් ගාස්තු
    - සේවා ගාස්තු: ගිවිසුමේ වටිනාකමට අනුව/ වාහනයේ වර්ගය අනුව (පහත වගුව බලන්න)
    - රක්ෂණ වාරික ගාස්තුව: රක්ෂණ මිල ගණන් අනුව (වාරිකය මුදල් ලෙස හෝ / සහන කාලයක් ඇතුලත ගෙවිය හැක)
    - RMV හුවමාරු ගාස්තුව: RMV මාර්ගෝපදේශ අනුව
    - වාහන උකස් බැඳුම්කර සැකසුම් ගාස්තුව සඳහා රු. 6,000/-
    - තැපැල් ගාස්තු – සාමාන්‍ය තැපෑල : රු. 66.75/- | ලියාපදිංචි තැපෑල : රු. 128/-

වාහන ණය

- මෝටර් රථ රෙජිස්ටාර් (RMV) විසින් පිළිගත් සියලුම වාහන කාණ්ඩ වලට අපි පහසුකම් සපයන්නෙමු.
- උදා: මෝටර් කාර්, වෑන්, ද්විත්ව කාර්යය වාහන, මෝටර් ලොරි, ඉඩම් වාහන, මෝටර් කෝච් (බස්), ත්‍රිරෝද රථ, මෝටර් බයිසිකල් ආදිය.
- අප විසින් අනුමත කරන ලද නියමයන් සහ කොන්දේසි වලට යටත්ව, ඔබට ඔබේ ආදායම් උත්පාදන රටාවට ගැලපෙන, සමාන කුලී හෝ ව්‍යුහගත ගෙවීම් වලින් ආපසු ගෙවිය හැක.

- **1990 අංක 3 දරන උකස් පනත (සංශෝධන) සහ ගිවිසුම් නීතිය වාහන ණය සම්බන්ධයෙන් කටයුතු කරන නීති පනත වේ.**
- **පොලී සහ දඩ පොලිය**
  - **පොලී අනුපාතය: අවම අනුපාතය - 17.50% (වසරකට), උපරිම අනුපාතය- 25.00% (වසරකට)**
  - **දඩ පොලිය: නියමිත පොලියට අමතරව - 4.5% (මාසිකව)**
- **වෙනත් ගාස්තු**
  - **සේවා ගාස්තු: ගිවිසුමේ වටිනාකමට අනුව/ වාහනයේ වර්ගය අනුව (පහත වගුව බලන්න)**
  - **රක්ෂණ වාරික ගාස්තුව: රක්ෂණ මිල ගණන් අනුව (වාරිකය මුදල් ලෙස හෝ / සහන කාලයක් ඇතුලත ගෙවිය හැක)**
  - **RMV හුවමාරු ගාස්තුව: RMV මාර්ගෝපදේශ අනුව**
  - **වාහන උකස් බැඳුම්කර සැකසුම් ගාස්තුව සඳහා රු. 6,000/-**
  - **තැපැල් ගාස්තු – සාමාන්‍ය තැපෑල : රු. 66.75/- | ලියාපදිංචි තැපෑල : රු. 128/-**

**ඉඩම් උකස් ණය (දේපල ණය)**

- **ඉඩම් උකස් ණය සඳහා, අපට නිශ්චල දේපලක් මත මූලික උකසක් අවශ්‍ය වන අතර, එය වෘත්තීය තක්සේරුකරුවෙකු විසින් අගය කළ යුතුය.**
- **උපරිම ණය මුදල නිශ්චල දේපලෙහි වෙළඳපල වටිනාකමෙන් 70% ක් වන අතර උපරිම ආපසු ගෙවීමේ කාලය මාස 60 (වසර 05) වේ.**
- **1990 අංක 3 දරන උකස් පනත (සංශෝධන) සහ ගිවිසුම් නීතිය යනු නිශ්චල දේපල ණය සම්බන්ධයෙන් කටයුතු කරන නීති පනත වේ.**
- **පොලී සහ දඩ පොලිය**
  - **පොලී අනුපාතය: අවම අනුපාතය - 18.00% (වසරකට), උපරිම අනුපාතය - 25.00% (වසරකට)**
  - **දඩ පොලිය: නියමිත පොලියට අමතරව - 4.5% (මාසිකව)**
- **වෙනත් ගාස්තු**
  - **සේවා ගාස්තුව: ගිවිසුමේ වටිනාකමට අනුව (පහත වගුව බලනන)**
  - **රක්ෂණය (DTA): අදාළ නම් - රක්ෂණ මිල ගණන් අනුව**
  - **රක්ෂණය (Title රක්ෂණය): අදාළ නම් - රක්ෂණ මිල ගණන් අනුව**
  - **මුද්දර ගාස්තු: ගිවිසුමේ වටිනාකමින් 0.1% (ලබාගත් ඉල්ලුමේ පොරොන්දු පත්‍රය සඳහා )**
  - **නෛතික ගාස්තුව: ගිවිසුමේ වටිනාකමට අනුව**
  - **තක්සේරු ගාස්තුව: දේපල වටිනාකම අනුව**

- 

පුද්ගලික ණය

- ඔබේ ජීවිතයේ ඇති බොහෝ විශේෂ දේවල් සඳහා අවශ්‍ය වන සියලුම උපකාරයන් කිරීමට අපි මෙහි සිටිමු.
- සිංගර් ෆිනෑන්ස් හි අපට, සෑම ණයක්ම පුද්ගලික වන බැවින්, ඔබේ අවශ්‍යතාවයට අනුකූලව විශේෂයෙන් නිර්මාණය කර ඇති සහ ඔබේ සියලු සුවිශේෂී අවශ්‍යතා වලට ගැලපෙන ලෙස අපගේ පුද්ගලික ණය යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත.
- පොලී සහ දඩ පොලිය
  - පොලී අනුපාතය: අවම අනුපාතය - 18.50% (වසරකට), උපරිම අනුපාතය - 40.00% (වසරකට)
  - දඩ පොලිය: නියමිත පොලියට අමතරව - 4.5% (මාසිකව)
- වෙනත් ගාස්තු
  - සේවා ගාස්තු: ගිවිසුමේ වටිනාකමට අනුව (පහත වගුව බලන්න)
  - රක්ෂණ වාරික ගාස්තුව: රක්ෂණ මිල ගණන් අනුව
  - මුද්දර ගාස්තු: ගිවිසුමේ වටිනාකමින් 0.1% (ලබාගත් ඉල්ලුමේ පොරොන්දු පත්‍රය සඳහා)
  - තැපැල් ගාස්තු – සාමාන්‍ය තැපෑල : රු. 66.75/- | ලියාපදිංචි තැපෑල : රු. 128/-

ස්ථාවර තැන්පතු ණය (තාවකාලික ආපසු ගෙවීම්)

- තැන්පතු කරුවන්ට තම ස්ථාවර තැන්පතු ප්‍රාග්ධනයෙන් උපරිම වශයෙන් 75% (ස්ථාවර තැන්පතුවලට පොළිය මාසිකව ගෙවන්නේ නම්) හෝ 80% (කල්පිරීමේදී පොලී ගෙවන්නේ නම්) දක්වා තාවකාලික ආපසු ගෙවීම් (ණය) ලබා ගත හැකිය.
- ස්ථාවර තැන්පතු මත පොලී අනුපාතයට අමතරව වසරකට 5% ක සියල්ල ඇතුළත් සේවා ගාස්තුවක් මෙවැනි ආපසු ගෙවීම් සඳහා අය වේ.
- මෙම පහසුකම කළමනාකාරිත්වයේ අභිමතය පරිදි ලබාදෙන අතර, ඕනෑම අවස්ථාවක තාවකාලික ආපසු ගෙවීම් සඳහා අය කරන සේවා ගාස්තුව වෙනස් කිරීමට සමාගමට අයිතිය ඇත.

සමූහ විකුණුම්

- මෙම සුවිශේෂී පහසුකම රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම පිළිගත් ආයතනවල සේවක මණ්ඩලය සඳහා ලබා ගත හැකිය.
- මෙම ආයතනවල සේවකයින්ට ඕනෑම පාරිභෝගික භාණ්ඩයක් තෝරාගෙන ඒ සඳහා මුළු මුදලම එකවර නොගෙවා, මාසික වාරික වශයෙන් ගෙවීමේ හැකියාව ඇත.
- මෙම වාරික අදාළ සේවකයාගේ වැටුපෙන් අඩු කර අදාළ ආයතන විසින් අප වෙත එවනු ලැබේ.
- පාරිභෝගිකයින් හට පළමු දිනයේ සිටම නිෂ්පාදනයේ ප්‍රතිලාභ භුක්ති විඳීමේ හැකියාව ඇත.

- මෙම පහසුකම අධීක්ෂණය කිරීම සඳහා අප ප්‍රධාන කාර්යාලයේ අති නවීන තොරතුරු තාක්ෂණ පද්ධතියක් සහ දක්ෂ කාර්ය මණ්ඩලයක් සහිත කැප වූ ඒකකයක් පිහිටුවා ඇත.
- අප මෙම අංශයේ වෙළෙඳපොළ ප්‍රමුඛයා වෙමින් දිවයින පුරා පිහිටි ප්‍රසිද්ධ ආයතන 400කට අධික සංඛ්‍යාවක සේවක සේවිකාවන්ට මෙම මූලය‍්‍ය පහසුකම සපයා ඇත.
- පොලී සහ දඩ පොලිය
    - පොලී අනුපාතය: අවම අනුපාතය - 30.00% (වසරකට), උපරිම අනුපාතය - 42.00% (වසරකට)
    - දඩ පොලිය: අදාළ නොවේ.
    - වෙනත් ගාස්තු: අදාළ නොවේ.

ක්ෂුද්‍ර මූල්‍ය

- මෙම ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම හරහා ව්‍යවසායකයින් හට කණ්ඩායමක් ලෙස ණය පහසුකම් සඳහා අයදුම් කිරීමට හැකියාව ඇත.
- කුඩා ව්‍යවසායකයින් ඔවුන්ගේ යන්ත්‍රෝපකරණ සහ උපකරණ, ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් සඳහා අරමුදල් සැපයීමට, තොග සැපයුම්, සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මෙම ණය මුදල ඉල්ලුම් කරනු ලබයි.
- 2016 අංක 6 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනත සහ ගිවිසුම් නීතිය යනු ක්ෂුද්‍ර ණය සම්බන්ධයෙන් කටයුතු කරන නීති පනත වේ.
- පොලී සහ දඩ පොලිය
    - පොලී අනුපාතය: අවම අනුපාතය - 35.00% (වසරකට), උපරිම අනුපාතය - 40.00% (වසරකට)
    - දඩ පොලිය: අදාළ නොවේ.
- වෙනත් ගාස්තු
    - සේවා ගාස්තු: ගිවිසුමේ වටිනාකමින් 3%
    - ණය කළමනා කරණ අරමුදල: ගිවිසුමේ වටිනාකමින් 2%
    - ඇතුල්වීමේ ගාස්තුව: රු.500/- (පළමු චක්‍රය සඳහා පමණි)
    - ණය සැකසුම් ගාස්තුව සඳහා: රු.300/- (ඉතිරි කිරීම් ගිණුම් ආරම්භ කිරීම සඳහා)
    - මුද්දර ගාස්තු: ගිවිසුමේ වටිනාකමින් 0.1% (ලබාගත් ඉල්ලුමේ පොරොන්දු පත්‍රය සඳහා)

සාධ්‍යකරණය (ෆැක්ටරින්)

- සාධ්‍යකරණය (ෆැක්ටරින්) යනු ණය කොන්දේසි මත භාණ්ඩ හා සේවා අලෙවි කරන ව්‍යාපාරයක මුදල් ප්‍රවාහය වැඩිදියුණු කිරීම සඳහා නිර්මාණය කර ඇති කාරක ප්‍රාග්ධන විසඳුමකි.

- 
- බැංකු අරමුදල් සැපයීම නොකරන විට පවා, සාධ්‍යකරණය (ෆැක්ටරින්) මඟින් මූල්‍ය පහසුකම් සපයා ගත හැකිය.සපයන ලද නිෂ්පාදන හෝ සපයනු ලබන සේවාවන් සඳහා නිකුත් කර ඇති ඉන්වොයිසි සඳහා මුදල් ලැබීමේ වඩාත්ම කාර්යක්ෂම ක්‍රමය මෙයයි.
- සාධ්‍ය කරණයේදී අපි ඔබගේ ලැබිය යුතු ණය මත කරන ලද විකුණුම් වට්ටමක් යටතේ මිලදී ගෙන ඔබට 70% - 85% ක මුදල් අත්තිකාරමක් ලබා දෙන්නෙමු.ණය ගැතියන් ඔවුන්ගේ ගෙවීම් කරන තුරු ඔබට අප විසින් ඔබේ ණය ගැතියන් වෙනුවෙන් ඔබට ගෙවන්නෙමු.සාධ්‍ය කරණය මඟින් ණය කළමනා කරණයේ ඔබේ ව්‍යාපාරයේ වර්ධනය වේගවත් කළ හැකිය.
- අමතර ඇපකරයක් තිබේ නම්, එනම් දේපලක් හෝ වාහනයක් මත ප්‍රාථමික උකසක් තිබේ නම්, 1990 අංක 3 දරන උකස් පනත (සංශෝධන) සාධ්‍යකරණය (ෆැක්ටරින්) සම්බන්ධයෙන් කටයුතු කරන නීති පනතට අදාළ වේ.
- පොලී සහ දඩ පොලිය
    - පොලී අනුපාතය: අවම අනුපාතය - AWPLR (මසකට) + 06%, උපරිම අනුපාතය - AWPLR (මසකට) + 33%
    - දඩ පොලිය: නියමිත පොලියට අමතරව - අවම අනුපාතය 36% (වසරකට), උපරිම අනුපාතය 54% (වසරකට)
    - ෆැක්ටරින් ගාස්තු: අවම අනුපාතය 0.20%, උපරිම අනුපාතය 0.4%
    - සේවා ගාස්තු: අවම අනුපාතය 0.1%, උපරිම අනුපාතය 0.7% (ඉන්වොයිසි අගය මත පදනම්ව)
    - අධික ගෙවීම් සඳහා අය කරන ගාස්තුව: වාර්ෂිකව 24% සිට 36% දක්වා.

සේවා ගාස්තු වලට අදාල වගුව

| වර්ගය | | සේවා ගාස්තු මුදල (රු.) |
|---|---|---|
| මොටර් බයිසිකල් | ඕනෑම මුදලක් | 4,500 |
| ත්‍රිරෝද රථ | ඕනෑම මුදලක් | 7,000 |
| කුඩා කාර් /ද්විත්ව කාර්ය වාහන | රු.999,999 දක්වා (1000CC ට අඩු) | 10,000 |
| | රු.1,000,000ට වැඩි (1000CC සහ ඊට වැඩි) | 13,000 |

| | | |
|---|---|---|
| | 999,999 සහ ඊට අඩු | 11,000 |
| | 1,000,000-1,999,999 | 16,000 |
| | 2,000,000-2,999,999 | 22,000 |
| | 3,000,000-4,999,999 | 24,000 |
| කාර්/වෑන්/සිංගල් කැබ්/ඩබල් කැබ්/ මෝටර් කෝච් (වෑන්) | 5,000,000-11,999,999 | 32,000 |
| | 12,000,000-19,999,999 | 50,000 |
| | 20,000,000-29,999,999 | 70,000 |
| | 30,000,000-49,999,999 | 80,000 |
| | 50,000,000 සහ ඊට වැඩි | 100,000 |
| රෝද දෙකේ ට්‍රැක්ටර් - අලුත් (ලියාපදිංචි කර නොමැති) | ඕනෑම මුදලක් | 7,500 |
| | 499,999 සහ ඊට අඩු | 10,000 |
| රෝද හතරේ ට්‍රැක්ටර් - ලියාපදිංචි කර ඇති | 500,000-999,999 | 15,000 |
| | 1,000,000 1,999,999 | 21,500 |
| | 2,000,000 ට වැඩි | 26,500 |
| රෝද හතරේ ට්‍රැක්ටර් - අලුත් (ලියාපදිංචි කර නොමැති) | ඕනෑම මුදලක් | 30,000 |
| | 500,000 සහ ඊට අඩු | 13,000 |
| අනෙකුත් සියලුම කාණ්ඩ | 500,000-999,999 | 16,500 |
| | 1,000,000 - 1,999,999 | 22,500 |
| | 2,000,000-2,999,999 | 30,000 |

ආරක්ෂිත ගනුදෙනු ලියාපදිංචි කිරීමේ පද්ධතිය (Secured Transactions Registry System – StrS) තුළ ඇපය ලියාපදිංචි කළ යුතු පහසුකම් සඳහා රු. 1,500/- ක ගාස්තුවක් අය කෙරේ.

මෙහි පැමිණිලි හෝ යෝජනා ඉදිරිපත් කළ හැක.
අවශ්‍ය නම් පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය මෙම සබැඳියෙන් බාගත කළ හැක.